# බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

## හදාවඩා ගැනීම (කුලවද්දා ගැනීම) සඳහා වෙන් කළ දරුවන්ගේ නාම ලේඛනය 2023

2023 වර්ෂයට අදාල දේශීය දරුවන් කුලවැද්දීමේ ලේඛනය පහත සඳහන් ස්ථානයන්හි ප්‍රසිද්ධ කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දැන්වීම් පුවරුව
- බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දැන්වීම් පුවරුව
- බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දැන්වීම් පුවරුව
- සියළුම පරිවාස කාර්යාලවල දැන්වීම් පුවරු
- ප්‍රජාපති රජයේ භාරගැනීමේ දැන්වීම් පුවරුව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැන්වීම් පුවරු

දරුවන් හදාවඩා ගැනිම සඳහා බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී බලපත්‍ර ලබාගෙන ඇති ඉල්ලුම්කරුවන්ට මෙම දරුවන් හදාවඩා ගැනීම සඳහා ඉල්ලුම් කල හැක. දරුවන් හදාවඩා ගැනීමට ඉල්ලුම් කිරීමේදී පහත සඳහන් වයස් සීමාවන්ට අදාල වන සේ තම ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

| අඹු සැමි දෙදෙනාගෙන් වයස අඩු තැනැත්තාගේ වයස | ලබා දිය හැකි දරුවන්ගේ අවම වයස |
|---|---|
| අවුරුදු 45 දක්වා | ඕනෑම වයසක දරුවකු |
| අවුරුදු 46 සිට 50 දක්වා | අවුරුදු 1 ට වැඩි දරුවකු |
| අවුරුදු 51 සිට 55 දක්වා | අවුරුදු 5 ට වැඩි දරුවෙකු |
| අවුරුදු 56-60 දක්වා | අවුරුදු 8ට වැඩි දරුවෙකු |

ඉල්ලුම්කරුවන් කුලවැද්දුම් ලේඛනයෙහි සඳහන් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත ගොස් දරුවන් දැක බලාගෙන තම ඉල්ලීම් මෙයට අමුණා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුව සකස් කර දෙදෙනා විසින්ම අත්සන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කොමසාරිස්,<br>
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (බ.ප.),<br>
අංක.204,<br>
8 වන මහල,<br>
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
බත්තරමුල්ල.

ඉල්ලුම් පත්‍රයේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති බලපත්‍ර අංකය සහ දිනය සඳහන් කල යුතු අතර තෝරා ගන්නා ළමයා පිළිබඳව විස්තරද සඳහන් කළ යුතුය. ඉල්ලුම්කාර යුවලට දරුවන් තිදෙනෙකු සඳහා ඉල්ලුම් කළ හැක. <u>ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ "දේශීය කුලවද්දා ගැනීම 2023 " යනුවෙන් සඳහන් කල යුතුය.</u> ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය -: **2023.09.21** දින වේ. එදිනට පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සුදුස්සන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් සිදු කරනු ලැබේ.

කොමසාරිස්,<br>
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (බ.ප.),

CamScanner